# නොබැඳි ව්‍යාපාරයේ ආරම්භය හා ක්‍රියාකාරීත්වය පිළිබඳ විමර්ශනයක්

ප්‍රියන්ත මුදලිගේ

## හැඳින්වීම

දෙවන ලෝක යුද්ධයෙන් පසු උදාවෙතැයි බලාපොරොත්තු වුණු පූර්ණ සාමකාමී තත්ත්වයක් ඒ අන්දමින් ම බිහිවූයේ නැත. යුද්ධය පැවති කාලයේ ම ජයග්‍රාහී රටවල් අතර ලියලමින් තිබුණු ප්‍රතිවිරෝධතා අනුක්‍රමයෙන් සටන ස්වරූපයක් බිහිකරමින් එලිපිට ප්‍රදර්ශනයවන්නට පටන් ගත්තේය. පළමුව යුද්ධයෙන් අඩුම අලාභ හා වැඩිම වාසි ගත් ඇමරිකා එක්සත් ජනපදය ධනේශ්වර ලෝකයේ නායකත්වය ගත්තේය. දෙවනුව බලවත් රාජ්‍යවූයේ සෝවියට් දේශයයි. ධනවාදී හා සමාජවාදී වශයෙන් ඇමරිකා එක්සත් ජනපදය හා සෝවියට් නායකත්වය යටතේ කඳවුරු දෙකක් ලෝක දේශපාලන ක්‍රියාවලිය තුළ බිහිවෙමින් පැවතියේය. මේ අතර බ්‍රිතාන්‍ය, ප්‍රංශය, පෘතුගීසි වැනි පැරණි අධිරාජ්‍යවාදී රටවල් යුද්ධය නිසා දුර්වල තත්ත්වයකට පත්වීමත්, ඒ සමගම යටත් විජිතවල ජාතික නිදහස් සටන් උග්‍රවීමත් හේතුකොට ගෙන අලූත් ලෝකයක් බිහිවන්නට වූයේ ය. විශේෂයෙන් ආසියාවෙත්, අප්‍රිකාවෙත් ජාතිහු නිදහස පතා දැඩි සටන් ගෙනගියහ. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට විරුද්ධව දැඩි සටනක් කළ ඉන්දියාව නිදහස දිනාගැනීම ආසියාවේ යටත් විජිත සැකසීමේ බලවත් පිපිරීමක් විය. මේ පසු බිම තුළ එනම් දෙවන ලෝක යුද්ධයෙන් පසු අධිරාජ්‍ය ධනේශ්වර ක්‍රමය හැඩගැස්සීමේ නායකත්වයගත් ඇමරිකාවත්, සමාජවාදී රටවල නායකත්වය ගත් සෝවියට් දේශයත් කඳවුරු දෙකක් විය (නොබැඳී මාවත,1976). මෙම බලකඳවුරුවාදය ලෝක දේශපාලනය කෙරෙහි බලපෑම් කරන ලදී.

මේ අනුව දෙවන ලෝක යුද්ධයෙන් පසුව යටත්විජිතවාදයෙන් නිදහස් වූ රටවල් සමූහය සෙසු රටවලින් වෙන්කොට හඳුනාගැනීම අවශ්‍ය වූ අතර එම නිසා එය තුන්වන ලෝකය ලෙසින් ද හඳුන්වනු ලැබේ. වර්තමානයේ මෙම රටවල් සංවර්ධනය වෙමින් පවතින රටවල් ලෙසින් ද හඳුන්වනු ලැබේ. ජාතික නිදහස් ව්‍යාපාරයන්ගෙන් ජයග්‍රහනය ලැබූ ජාතීන්ට මෙතෙක් තමන්ගේ පාලකයන් සේ සිටි විදේශීය බලවත් රාජ්‍යයන් සමග කවදුරටත් එක්සත්ව කටයුතු කරන්නේ ද, එසේ නොමැතිනම් විරුද්ධත්වයක් දක්වන්නේද යන්න පිළිබඳව ප්‍රශ්නයකට මුහුණදෙන්නට විය. මෙම ප්‍රශ්නයේ දී නව නිදහස් ජාතීන් වැඩිදෙනෙකුගේ අදහසවූයේ ජාත්‍යන්තරවශයෙන් නම් ප්‍රතිපත්තිය වියයුත්තේ බලවත් රාජ්‍යයන්ට පක්ෂව හෝ විපක්ෂව නොසිට මධ්‍යස්ථව සිටියයුතුය යන්නයි. මෙම ප්‍රතිපත්තිය ජාත්‍යන්තර වශයෙන් වැදගත් ස්ථානයක් ලබාගත් අතර පසුකාලීනව දේශපාලන න්‍යායක් වශයෙන් වැඩෙන්නට වූයේ නොබැඳි පිළිවෙත නමිනි (අබේවර්ධන,2000). මේ අනුව නොබැඳිබව (Non Alignment) යන වචනය පොදුවේ භාවිතකරනු ලබන්නේ බලකඳවුරු දෙකෙන් එකකටවත් නොබැඳි ජාතීන් අනුගමනය කළ විදේශ ප්‍රතිපත්තිය හැඳින්වීම සඳහා ය. තුන්වැනි ලෝක යුද්ධයක් ඇතිවීම වැලැක්වීම, ජාතික විමුක්ති ව්‍යාපාරයන්ට සහයෝගය දීම, අධිරාජ්‍යවාදයෙන් මිදී නිදහස දිනාගත් රටවලට ආර්ථික විමුක්තිය ලබාගැනීම පිණිස මඟපෙන්වීම, විවිධ සමාජක්‍රම පවතින රටවල් අතර සාමකාමී